002

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) කිතු උපතෙහි විශේෂත්වය සනිටුහන් කරමින් රන්, තුවරලා, ගන්ධරස පුදකලේ,

(1) රජවරු (2) ශාස්ත්‍රවන්තයින්
(3) එඬේරු (4) පූජකවරු

(02) ලාංකීය ජනතාවගේ ලෙසට අපට උරුම සංස්කෘතික අගයන් භාවිතයේදී කිතුනුවා,

(1) ජනතාවගේ කැමැත්තට අනුව ක්‍රියා කළ යුතු වේ.
(2) ඇදහිල්ලට හා ශුද්ධ බයිබලයට පදනමට අනුව පටහැනි නොවන ලෙස ක්‍රියා කළ යුතු වේ.
(3) අසල්වැසියන්ගේ සිත් දිනා ගැනීමට ඉතා ඉහලින් ක්‍රියා කළ යුතු වේ.
(4) තමාගේ අභිමතය පරිදි කළ යුතු වේ.

(03) ජුදෙව් සමාජයේ පිරිමි දරුවන්ට ටෝරාව ඉගෙනීමට අවස්ථාව හිමිවන්නේ වයස අවුරුදු,

(1) 10 දී ය. (2) 16 දී ය. (3) 12 දී ය. (4) 18 දී ය.

(04) යුදා සමාජයේ සිනගෝගයේදී ප්‍රධාන කාර්යය වූයේ කුමක්ද?

(1) සහනාධාර ලබා දීම (3) නඩු විසඳීම
(3) ආගමික දැනුම " ඉගැන්වීම" තුළින් ලබා දීම. (4) ශ්‍රාවකයින් පුහුණු කිරීම.

(05) ග්‍රීක නාමයක් දැරූ ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකි,

(1) ජේදුරු (2) තෝමස් (3) පිලිප් (4) ක්ලෙයෝපස්

(06) නපුරු බලය තමන්ට අවනත වීම නිසා නොව, ස්වර්ගයෙහි නම ලියැවී ඇති නිසා ප්‍රීති වන්න යැයි කීවේ කාටද?

(1) ශ්‍රාවකයන්ට (2) සද්දුසිවරුන්ට (3) පාවුල්ට (4) පරිසිවරුන්ට

(07) පැරණි ගිවිසුමෙහි ගින්න සංකේතවත් කෙරෙනුයේ,

(1) දෙවියන් වහන්සේගේ බලය පෙන්වීම.
(2) දෙවියන් වහන්සේගේ වැඩසිටීම.
(3) දෙවියන් වහන්සේගේ කරුණාව පෙන්වීම.
(4) දෙවියන් වහන්සේගේ මහිමය පෙන්වීම.

(08) ප්‍රේමයෙන් තොර වී ආගමික පිළිවෙත් කෙරෙහි පමණක් ගැතිවීමේ නිසරු කම පිළිබඳව ජේසුස් වහන්සේ ඉගැන්වූ අවස්ථාවක් වන්නේ,

(1) පාද සේදීමේ පිළිවෙත ඉටු නොකිරීමෙන්.

(2) අලුත් ඇඳුමට අලුත් අන්ඩයක් නොඇමීමෙන් .

(3) සමාරිය ස්ත්‍රියකගෙන් වතුර ඉල්ලීමෙන්.

(4) අත් සේදීමේ පිළිවෙත ඉටු නොකිරීමෙන්.

(09) "ඉසිලුවේ අපේ දුකය, දරා ගත්තේ අපේ පීඩාය, තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය." මෙසේ පැවසුවේ,

(1) මීකා ය. (2) එසකියල් ය. (3) මලාකි ය. (4) යෙසායා ය.

(10) ජුදයේ බෙත්ලෙහෙම නම් දාවිත් නුවර කිතු උපත සිදුවන බව අනාවැකි පැවසුවේ,

(1) ආමොස් (2) යෙසායා (3) මලාකි (4) එසකියල්

(11) ජේසුස් වහන්සේගේ දහඩිය බිංදු ලේ බිංදු බවට පත් වූ මොහොතක් වූයේ,

(1) ගෙත්සෙමන උයනේ කල යාච්ඤාවේ දී. (2) උඩුමහල් මැඳුරේ දී.

(3) කුරුසිපත් වූ මොහොතේ දී. (4) කුරුසිය ඔසවා යන මොහොතේ දී.

(12) ''මාගේ මෑණියොත් මාගේ සහෝදරයොත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා පිළිපදින්නෝ වෙති.'' මින් අදහස් කරන්නේ,

(1) ජේසුස්වහන්සේට සහෝදරයන් නොසිටි බව.

(2) වචනය අසා එය පිළිපැදිය යුතු බව.

(3) වචනය ඇසීමට පමණක් ප්‍රිය කරන අය බව

(4) ජේසුස් වහන්සේ සහෝදරයන් නොසලකා හැරිය බව.

(13) ජේසුස් වහන්සේගේ හැදුනු වැඩුණු නගරය වන්නේ,

(1) කානාන් (2) සමාරිය (3) නාසරෙත් (4) බෙත්සයිදා

(14) අසීසියේ ෆ්‍රැන්සිස් තුමාගේ යැදුමට එතුමා ඉල්ලා සිටි වරප්‍රසාද අතර ප්‍රධාන වන්නේ,

(1) ඔබගේ උපකරණයක් කරගත මැනව.

(2) ප්‍රේමයද අසමගිය ද ඇති තැන ශාන්තිය කළ මැනව.

(3) අවිශ්වාසයෙන් යුතු තැනට විශ්වාස දුන මැනව.

(4) මේ සියල්ලම.

(15) ව්‍යවස්ථාවට අටුවා සම්පාදනය කළ අය වන්නේ,

(1) විනයධරයන් (2) එසිනවරුන් (3) හෙරෝදිවරුන් (4) සෙලට්වරුන්

(16) මා අනුව එන්නයි ජේසුස් වහන්සේ ක්‍රියා කළ ආරාධනය පිළිගෙන ක්‍රියා කළේ,

(1) ස්තේපන් (2) මත්තියස්

(3) මතෙව් (4) පාවුල්

(17) මනුෂ්‍ය පුත්‍රයා සබත් දිනට පවා අධිපතියානෝය. ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශනයේ ඇති වැදගත්කම වන්නේ,

(1) මනුෂ්‍ය පුත්‍රයා උසස් බවයි.
(2) සබත් දවස නොසලකා හැරිය බවයි.
(3) නීතිරීති ලිහිල් විය යුතු බවයි.
(4) ජනතාව පෙළීමට තැත් කිරීම ප්‍රතික්ෂේප කිරීමයි

(18) තමකම නසා දමමින් ජේසුස් වහන්සේ කළ ප්‍රකාශයේ ඇති වැදගත්කම වන්නේ,

(1) ගෙත්සෙමන උයන යාච්ඤාවේදී
(2) නාසරෙත් ප්‍රකාශනයේදී
(3) කන්ද උඩ දේශනයේදී
(4) ස්වර්ගයට නැගීමේදී

(19) ජේසුස් වහන්සේට විරුද්ධව බොරු චෝදනා නගමින් උන්වහන්සේ පිළිබඳව අවසන් පියවර ගැනීමට රැගෙන ගියේ කා වෙත ද?

(1) සාවුල් වෙත
(2) ජුදස් වෙත
(3) පිලාත් වෙත
(4) ක්ලෙයෝපස් වෙත

(20) යුදෙව්වන් නින්දට යාමට පෙර සුපුරුදු යාච්ඤාව වූ, ජේසුස් වහන්සේ කුරුසයේ දී කළ වදනක් ද වන්නේ,

(1) පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාරගත මැනව.
(2) පියාණෙනි මොවුන්ට කමා වුව මැනව.
(3) නිම විය
(4) අදම ඔබ මා සමග පාරාදීසයේ සිටින්නෙහිය.

(21) ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය ප්‍රථමයෙන්ම අද්දුටු කාන්තාවන් සොහොන වෙත ගියේ,

(1) ජේසුස් වහන්සේ නැගිට ඇතැයි බැලීමටය.
(2) පෙරදින ලද දර්ශනයට අනුවය.
(3) මෘතදේහය සුවඳ තෙලින් ආලේප කිරීමටය.
(4) ශ්‍රාවකයන්ගේ කීමකට අනුව ය.

(22) ගතානුගතික අදහස් දැඩි ලෙස එල්බගෙන ක්‍රියා කළ කණ්ඩායමක් වන්නේ,

(1) සෙලට්වරු
(2) හෙරදිවරු
(3) සද්දිසිවරු
(4) එසීනවරු

(23) සද්දුසිවරු ජේසුස් වහන්සේ වෙත ඉදිරිපත් කළ ගැටලුවක් වන්නේ,

(1) අධිරාජ්‍යයට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය.
(2) සමරිතානුවන් ඇසුරු කිරීම පිළිබඳ ප්‍රශ්නය.
(3) දේව මාළිගාවේ රැඳී සිටීම පිළිබඳ ප්‍රශ්නය.
(4) සබත කඩ කිරීම පිළිබඳ ප්‍රශ්නය.

(24) ජේසුස් වහන්සේ තමන් වහන්සේ දේව පුත්‍රයා බව අවධාරණය කරමින් සද්දුසිවරු ඉදිරියේ ඉදිරිපත් කළ උපමාව වන්නේ,

(1) අබ ඇටය පිළිබඳ උපමාව
(2) මිදි වත්ත හා ගොවීන් පිළිබඳ උපමාව
(3) වපුරන්නාගේ උපමාව
(4) රන්කාසි දසය පිළිබඳව උපමාව

(25) " ගෘහ ශිල්පීන් ඉවතලූ ගල ම කොණේ ප්‍රධාන ගල වී ඇත" යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,

(1) තමන් වහන්සේ එළිදරව් වන දිනය ඇතක නොවන බව දැන සිටි නිසාය.
(2) තමන් වහන්සේ නැවත නැගිටින දිනය දැන සිටි නිසා ය.
(3) තමන් වහස්සේ පිළිගන්නා දිනය දැන සිටි නිසා ය.
(4) තමන් වහන්සේගේ සියල්ල හැර යන දිනය දැන සිටි නිසාය.

(26) සෙකරියා දිවැසිවරයාගේ පොතේ පවා පෙර අඟවා තිබූ ජේසුස් වහන්සේ පිළිබඳ සිදුවීම වන්නේ,

(1) ස්නාවක ජොහාන්ගෙන් බෞතීස්මය ලබන බව ය.
(2) සද්දුසිවරු ප්‍රතික්ෂේප කරන බව ය.
(3) අවුරුදු 12 දී ජෙරුසලෙම් දේව මාලිගයට පිවිසෙන බව ය.
(4) රජ කෙනෙකු සේ ජයාන්විතව ජෙරුසෙලමට පිවිසෙන බව ය.

(27) සහෝදරත්වය හා සහභාගීත්වය නොකඩවා පවත්වා ගැනීම සඳහා අවශ්‍යතාවය ඉටු වන්නේ,

(1) එකම රොටිය හා කුසලානය බෙදා ගැනීමෙනි.
(2) සහෝදරයන් සමග උත්සව පැවැත්වීමෙනි.
(3) සහෝදරයින්ට හැකි පමණින් සැලකීමෙනි.
(4) හැකි විට දේවස්ථානයට යෑමෙනි.

(28) ජන්ම පාපයේ විපාක වලින් අපට ගැලවීම අත් වූයේ,

(1) ජේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවා ගැනීම නිසා.
(2) ජේසුස් වහන්සේ කුරුසිපත් වූ නිසා.
(3) ජේසුස් වහන්සේ උපත ලද නිසා.
(4) ජේසුස් වහන්සේ නැවත නැගිටි නිසා

(29) හිස් වූ සොහොන හා සිදුරු වූ අත් පා දැකීම තුළින් උත්ථානය විශ්වාස කලේ,

(1) පේදුරු හා ක්ලෙයෝපස්
(2) පේදුරු හා තෝමස්
(3) තෝමස් හා පේදුරු
(4) ක්ලෙයෝපස් හා තෝමස්

(30) ස්තුතිවන්ත භාවය ඉස්මතු කරමින් ජේසුස් වහන්සේ අගය කළේ,

(1) අත පණ නැති මිනිසා සුව කළ අවස්ථාවේ.
(2) ලාදුරු රෝගීන් දස දෙනා සුව කළ අවස්ථාවේ.
(3) අංශභාග රෝගියා සුව කළ අවස්ථාවේ.
(4) අන්ධ මිනිසා සුව කළ අවස්ථාවේ.

(31) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳව ඉගැන්වීමට යොදා ගත් උපමාව වන්නේ,
(1) දැල පිළිබඳ උපමාව.
(2) නිධානය පිළිබඳ උපමාව
(3) මුතු ඇටය පිළිබඳ උපමාව
(4) අබ ඇටය පිළිබඳ උපමාව

(32) යහපත් කිතුනු පවුලක් ගොඩ නැගීමට,
(1) පවුලේ මූලිකත්වය පියාට දිය යුතු ය.
(2) පවුලේ මූලිකත්වය මවට දිය යුතු ය.
(3) පවුලේ මූලිකත්වය ක්‍රිස්තුස් වහන්සේට දිය යුතු ය.
(4) පවුලේ මූලිකත්වය නෑදෑයන්ට දිය යුතු ය.

(33) වර්තමාන ධර්මදූතයන්ට වඩා සතුටු විය යුත්තේ,
(1) සේවයේ දුෂ්කරතා මැඩලීමට හැකි වීම.
(2) තමාව සේවයට කැඳවීම පිළිබඳව ය.
(3) ඉටු කරන සේවයට නිසි වරප්‍රසාද ලැබීම පිළිබඳව ය.
(4) සේවයෙන් ලැබෙන ගෞරවය පිළිබඳ ය.

(34) දේව රාජ්‍ය වෙනුවෙන් කඳුලු හෙලන අයට,
(1) ප්‍රෘෂ්ධිමත් වේ.
(2) සිනාසීමට හැකි වේ.
(3) සා ගිනි නිවා ගැනීමට හැකි වේ
(4) දේව දරුකම හිමි වේ.

(35) "ඔබේ ඉගටිය බැඳ පහන් තබා දල්වා ගන්න" ජේසුස් වහන්සේ මෙලෙස කීවේ,
(1) ඉග පටි තද කර ගැනීම පිළිබඳය.
(2) උන් වහන්සේගේ මරණ මොහොත පිළිබඳවය.
(3) පහන් දල්වා තබා ගත යුතුය.
(4) උන් වහන්සේගේ නැවත වඩින මොහොතට සූදානම් වීම ය.

(36) දේව රාජ්‍යයේ පුරවැසියන් සඳහා නායකත්වය ධූරාවලියට අනුව,
(1) යටත් අය ඉහළින් සිටින අතර නායකයා සේවයට බැඳී සිටියි.
(2) යටත් අය ඉහළින් සිටින අතර නායකයාද ඉහළින් සිටියි.
(3) යටත් අය යටත් කොට ක්‍රියා කරයි.
(4) යටත් අය නායකයාට සේවය කරයි.

(37) දේවරාජ්‍යට කැඳවීමක් ලද කළ,
(1) මමත්වය නසා දැමිය යුතුය.
(2) අභිමානයෙන් සිටිය යුතුය.
(3) සොයා බලා කටයුතු කළ යුතුය.
(4) වරප්‍රසාද විමසා බැලිය යුතුය.

(38) ශ්‍රාවකයන් 12 දෙනාට හා 70 දෙනාට ලබා දුන් පොදු උපදෙසක් වන්නේ,
(1) නොපිළිගන්නා අයගෙන් ඉවත් වීම.
(2) සේවයට අවශ්‍ය දේ රැගෙන යන්න.
(3) කණ්ඩායම් වශයෙන් ගමන් කරන්න.
(4) තම හැකියා උපරිමයෙන් යොදන්න.

(39) පිදීමේ වැදගත්කම ඉස්මතු කරමින් ජේසුස් වහන්සේ අගය කළේ,
(1) සමාරිය ස්ත්‍රියකගෙන් වතුර ඉල්ලීම.
(2) දුගී වැන්දඹුවන්ගේ පඬුර.
(3) මාර්තා හා මරියාගේ නිවසේ මරියාගේ ක්‍රියාව
(4) නායින් නුවර වැන්දඹුවන්ට කරුණාව දැක්වීම.

(40) කිතුනු දරුවෙකු ලෙස ඔබ තුළ තිබිය යුතුම වඩාත් ම වැදගත් ලක්ෂණයක් වන්නේ,
(1) වගකීමෙන් වැඩ කිරීමයි.
(2) කැපවීමෙන් සංවර්ධනයට දායක වීමයි.
(3) වැයවීමෙන් ජීවිතයක් ගත කිරීමයි.
(4) යුතුකම් සොයා බලා කටයුතු කිරීමයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | ක්‍රිස්තු ධර්මය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| කාලය / காலம் / Time | පැය 02 | |

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නයට හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(ii) පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10යි.

(01) (1) සැඩොක් නමැත්තාගෙන් පැවත එන්නේ කවුරුන්දැයි නම් කොට ඔවුන් තුළ හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයක් ලියන්න.

(2) තම පුත්‍රයා පිළිබඳ සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේ අඩංගු විශේෂ කරුණු 2ක් ලියන්න.

(3) ඇති නැති පරතරය පවතින සමාජයකට වෙනසක් කරා මග පෙන්වමින් ස්නාවක ජොහන්තුමා කළ ප්‍රකාශයක් ලියන්න.

(4) නාසරෙත් ප්‍රකාශනයට අනුව ජේසුස් වහන්සේගේ කරුණාවට භාජනය වන ජන කණ්ඩායම් දෙකක් ලියන්න.

(5) ගලීලයේ මුහුද හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

(6) "සෙමෙයොන්" යන වදනේ අර්ථය ලියන්න.

(7) දේව රාජ්‍යයේ පුරවැසියන්ගෙන් අපේක්ෂිත ලක්ෂණ දෙකක් ලියන්න.

(8) දේව රාජ්‍යයේ පුරවැසියන් සිය අවශ්‍යතාවල ඇලී ගැලී කරදර වීම අනවශ්‍ය බව ඇඟවීමට ජේසුස් වහස්සේ ඉදිරිපත් කළ නිදර්ශන දෙකක් ලියන්න.

(9) රන් අණ ලියන්න.

(10) කිතුනු ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග දෙකක් ලියන්න.

(02) සියළු කඳුහෙල් කපා පහත් කරනු ලබන්නේය. රළු තැන් සුමුදු කරනු ලබන්නේ ය.

(1) මෙලෙස සඳහන් වන්නේ කාගේ මෙහෙවර පිළිබඳව ද?

(2) ඉහත වාක්‍යයෙහි අදහස ලියන්න.

(3) ඉහත වාක්‍යයට අදාළව වර්තමානයේ ද ක්‍රියාකරන්නන් පිළිඳව ගත හැකි ක්‍රියා මාර්ග විස්තර කරන්න.

(03) (1) ආබ්‍රහම්ගේ පුත්‍රයා හා දියණිය ලෙස ජේසුස් වහන්සේ නම් කලේ කාව ද?

(2) ළදරුවන් අගය කරමින් ජේසුස් වහන්සේ කළ ප්‍රකාශනයන් දෙකක් ලියන්න.

(3) වර්තමාන සමාජය තුළ පිළිගැනීමට ලක් නොවේ යැයි සිතන කණ්ඩායම් දෙකක් නම් කොට ඒ අය වෙනුවෙන් කල හැකි දේ ලියන්න.

(04) (1) පරිසිවරුන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ විශේෂිත වූ කරුණු දෙකක් ලියන්න.

(2) ජේසුස්වහන්සේ හා පරිසිවරු අතර ගැටළු ඇති වූ අවස්ථා 3ක් නම් කරන්න.

(3) ජේසුස්වහන්සේ ඉගැන්වූ පරිදි " නීතියට වඩා ප්‍රේමයට මුල් තැන දිය යුතුය" යන මාතෘකාව යටත් සඟරාවකට ලිපියක් ලියන්න.

(05) (1) ජේසුස්වහන්සේ ජීවිතාදර්ශයෙන් යාච්ඤාවේ වැදගත් කම පෙන්වා දුන් අවස්ථා දෙකක් ලියන්න.

(2) රෝම ආණ්ඩුකාරයා ඉදිරියේ ජේසුස් වහන්සේට විරුද්ධව නැගුනු චෝදනා 3ක් ලියන්න.

(3) වර්තමානයේ අප යාච්ඤාවේ යෙදීමට යොමු වන අවස්ථා 03 ක් නම් කොට ඉන් එක් අවස්ථාවකදී කරනු ලබන යාච්ඤාවක් ලියන්න.

(06) (1) ලෞකික රාජ්‍යයක පවතින ලක්ෂණ වලට වඩා දේව රාජ්‍යයේ ඇති විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

(2) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳව ජේසුස්වහන්සේ ඉදිරිපත් කල උපමා 03ක් නම් කරන්න.

(3) එම උපමාවන්ගෙන් එක් උපමාවක අර්ථය ලියා දක්වමින් වර්තමාන සභාවේ වර්ධනයට ගත හැකි පියවර ලියන්න.

(07) පහත මාතෘකා අතරින් 2ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(1) ප්‍රේමයෙන් සතුරන් කෙරෙහි මෙත් සිත් වඩමු.

(2) දේව රාජ්‍ය පුරවැසියන් ලෙස නායකත්ව ධූරාවලියට එක්වෙමු.

(3) ජේසුස් වහන්සේගේ පුනරුප්පත්තිය අත්දුටුවෝ.

(4) නාසරෙත් ප්‍රකාශනයට අනුව ජේසුස්වහන්සේගේ මෙහෙවර ඉටුවූ අයුරු.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II** |

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 1 | (21) 3 | (31) 4 |
| (2) 2 | (12) 2 | (22) 3 | (32) 3 |
| (3) 3 | (13) 3 | (23) 1 | (33) 2 |
| (4) 3 | (14) 4 | (24) 2 | (34) 2 |
| (5) 3 | (15) 1 | (25) 1 | (35) 4 |
| (6) 1 | (16) 3 | (26) 4 | (36) 1 |
| (7) 2 | (17) 4 | (27) 1 | (37) 1 |
| (8) 4 | (18) 1 | (28) 2 | (38) 1 |
| (9) 4 | (19) 3 | (29) 2 | (39) 2 |
| (10) 2 | (20) 1 | (30) 2 | (40) 3 |

(ලකුණු 1 × 40 = 40)

## II පත්‍රය

(01) (1) සද්දුසි / දේවදූතයන් හා නැවත නැගිටීම පිළිබඳ විශ්වාස නොකිරීම / ස්නාවක යොහාන්ගේ බෞතීස්මය පිලි නොගැනීම / ලිඛිත දේ පමණක් පිලිගැනීම.

(2) සතුට හා සොම්නස ඇතිවීම/ බොහෝ දෙන උපත නිමිත්තෙන් ප්‍රීති වීම/ මිදි යුෂ මත්පැන් නොබීම/ මව්පියන් දරුවන් සමගි කිරීම.

(3) අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා.

(4) දිළිඳුන් / වහලුන් / අන්ධයන් / පීඩිත වූවන්.

(5) තිබේරියස් / ගෙනසෙරත්

(6) දේව බල ලකුණු

(7) අන් අය වෙනුවෙන් වැය වීම/ ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම / තම හැකියා උපරිම ලෙස කැප කිරීම.

(8) කපුටන් හා මානෙල් මල

(9) අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්තෙහිද? ඔබත් ඒ දේම කරන්න.

(10) ප්‍රේමය, දයාව, ඉවසීම ආදී ගුණාංග (ලකුණු 2 × 10 = 20)

(02) (1) ස්නාවක ජොහාන් (ලකුණු 02)

(2) සමාජයේ ප්‍රතික්ෂේප වූවන් සමානාත්මතාවයෙන් පිලිගැනීම පිළිබඳ අදහසකට ලකුණු දෙන්න. (ලකුණු 03)

(3) සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 05)

(03) (1) ආබ්‍රහම් හා කුදු ස්ත්‍රිය (ලකුණු 02)

(2) ළදරුවන් නොවලක්වා මා ලඟට එන්ට ඉඩ හරින්න/මක්නිසාද දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳුවන්ගේය/යමෙක් මේ කුඩා අයගෙන් එක්කෙනෙකුට බාධා කරනවාට වඩා එසේ කරන්නාගේ බෙල්ලේ ඇඹරුම් ගලක් එල්ලා ඔහු මුහුදේ දැමීම ඔහුට යහපත (ලකුණු 03)

(3) සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 05)

(04) (1) නීති වල බාහිර ස්වරූපයට මුල්තැන දීම / මංසන්ධිවල යාච්ඤා කිරීම/ සාමාන්‍ය ජනතාවට නීති පිලිපැදීමට පීඩා කිරීම (41 පිටුව) (ලකුණු 02)

(2) සබත කඩ කිරීම පිළිබඳ ප්‍රශ්ණය / උපවාසය පිළිබඳ ප්‍රශ්ණය / පව්කරුවන් පිලිගෙන කටයුතු කිරීම පිළිබඳව (ලකුණු 03)

(3) සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 05)

(05) (1) ශ්‍රාවකයන් තෝරා පත් කර ගැනීමේදී / රෝගීන් සුව කිරීමේදී / ගෙත්සෙමන උයනේදී (ලකුණු 02)

(2) ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම / අධිරාජ්‍යයාට බදු ගෙවීම තහනම් කිරීම / තමා ක්‍රිස්තුස් නම් රජෙකු බව ප්‍රකාශ කිරීම. (ලකුණු 03)

(3) සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 05)

(06) (1) ආධිපත්‍යය හා නායකත්වය දෙවියන්වහන්සේ සතුය/ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය පුරවැසි භාවය ලබයි. ප්‍රේමය මත කටයුතු කරයි. (86 පිටුව) (ලකුණු 02)

(2) අබ ඇටය පිළිබඳ උපමාව / මුහුන් පිළිබඳ උපමාව / වපුරන්නා පිළිබඳ උපමාව (ලකුණු 03)

(3) සුදුසු පිළිතුරට ලකුණු දෙන්න (ලකුණු 05)

(07) ලියා ඇති කෙටි සටහන් අනුව ලකුණු දෙන්න.

(1) 124 පිටුව

(2) 86 පිටුව

(3) 72 , 73 පිටු

(4) 27 - 28 පිටු (ලකුණු 5 × 2 = 10)